# දැන්වීමයි

## **2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ දෙවන සහ තෙවන වසර ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා නේවාසික පහසුකම් ලබාදීම.**

වැල්ලමඩම සංකීර්ණයේ පීඨ වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා 2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා නේවාසික පහසුකම් ලබාදෙනු ලබන්නේ පළමු වසර සහ අවසන් වසර සිසුන්ට නේවාසිකාගාර නිර්ණායක අනුව ප්‍රමුඛතාව ලබාදීමෙන් පසුවය.

ඒ අනුව,

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ දෙවන සහ තෙවන වසර (2023/2024 සහ 2022/2023 ප්‍රවේශ වර්ෂය) විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍ය ශිෂ්‍යාවන් සීමිත ප්‍රමාණයකට නේවාසික පහසුකම් සැපයිය හැක.

එබැවින් ඉහත ප්‍රවේශ වර්ෂ වල නේවාසික පහසුකම් අත්‍යාවශ්‍යම ශිෂ්‍ය ශිෂ්‍යාවන් පමණක් **2026.02.10** දිනට පෙර පහත සඳහන් අයදුම්පත සම්පූර්ණ කර පැමිණ භාර දීම හෝ ලියාපදිංචි තැපෑලෙන් **"සහකාර ලේඛකාධිකාරි, ශිෂ්‍ය කටයුතු අංශය, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර"** යන ලිපිනයට 2026.02.10 දිනට පෙර එවිය යුතුය.

**නියමිත කාලසීමාව තුළ අයදුම්පත් ඉදිරිපත් නොකරන ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සහ අසම්පූර්ණ තොරතුරු ඉදිරිපත් කරන ශිෂ්‍ය/ශිෂ්‍යාවන් නේවාසිකාගාර පහසුකම් ලබා දීම සඳහා සලකා බලනු නොලැබේ.**

**සැ.යු - නේවාසික පහසුකම් සඳහා අභියාචනා ඉදිරිපත් කිරිමේදී මෙම අයදුම්පතේ ඡායා පිටපතක් ළග තබා ගන්නා ලෙස දැනුම් දෙමි.**

**අයදුම්පත්‍රය - Application Download (Sinhala)**
**Application Download (English)**

සහකාර ලේඛකාධිකාරි
ශිෂ්‍ය කටයුතු අංශය
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර.

සහකාර ලේඛකාධිකාරි
ශිෂ්‍ය කටයුතු අංශය
2026.01.08

පිටපත - පීඨාධිපති /මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
නියෝජ්‍ය ලේඛකාධිකාරි (වැ.බ) /මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය